# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපායස , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1173/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 16/07/2024 පැය 1420

## මාධ්‍ය නිවේදනය

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුර .**

2024.07.16 වන දින අළුයම් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් පුත්තලම පොලිස් වසමේ පුත්තලම ප්‍රදේශයේ වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 03 මිලි ග්‍රෑම් 190 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පුත්තලම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වූ වේට්ටාලෙ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** පුත්තලම පොලිස් ස්ථානය මඟින් වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**02. බලපත්‍ර නොමැතිව එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදා ගනිමින් පස් කැණීම් කල සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සෙට්ටිකුලම කඳවුර.**

2024.07.15 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සෙට්ටිකුලම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සෙට්ටිකුලම පොලිස් වසමේ මොහන්තාන්කුලම් වැව් ඉස්මත්ත වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදා ගනිමින් පස් කැණීම් කරමින් සිටි සැකකරුවකු අත්අඩංගුවට ගෙන සෙට්ටිකුලම් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වූ කිතුල්ගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** සෙට්ටිකුලම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුලියන්කුලම කඳවුර.**

2024.07.15 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුලියන්කුලම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් නෙදුන්කේණි පොලිස් වසමේ වේලන්කුලම් ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් සොයාගෙන නෙදුන්කේණි පොලිස් ස්ථානය වෙත භාර ඇත.

සැකකරුවන් සම්බන්ධයෙන් අනාවරණය වී නොමැති අතර නෙදුන්කේණි පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. බලපත්‍ර නොමැතිව මහඔය තුලට ට්‍රැක්ටර් රථ 02 ක් ඇතුළු කර වැලි කැණීම් කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මහඔය කඳවුර.**

2024.07.15 වන දින උදේ කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මහඔය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මහඔය පොලිස් වසමේ බැදිරැක්ක ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව මහඔය තුලට ට්‍රැක්ටර් රථ 02 ක් ඇතුළු කර වැලි කැණීම් කර ප්‍රවාහනය සඳහා සූදානම් කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන මහඔය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 21 හා 34 වයස් වල පසුවන මහඔය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.** මහඔය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. බලපත්‍ර නොමැතිව පතල් කැණීම් කටයුතු සිදු කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර.**

2024.07.15 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් බුත්තල පොලිස් වසමේ මහගොඩයාය ප්‍රදේශයේ වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව එක්ස්කැවේටර් යන්ත්‍රයක් මඟින් පතල් කැණීම් කරමින් සිටි සැකකරුවෙකු කැණීම් කිරීමට යොදා ගත් උපකරණ සමඟ අත්අඩංගුවට ගෙන මොණරාගල මැණික් හා ස්වර්ණාභරණ කාර්යාලයේ නිලධාරීන් වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වූ ඌව පැල්වත්ත ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**